මුදල්,ක්‍රම සම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

# සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය

# ලංසු ආරාධනය (IFB)

## සනීපාරක්ෂක හා පිරිසිදු කිරීමේ සේවා සැපයීම 2025/2026

| ලංසු අංකය | විස්තරය |
|---|---|
| ETF/PROC/A/2025/038 | ප්‍රධාන කාර්යාලය |
| ETF/PROC/A/2025/039 | ප්‍රාදේශීය කාර්යාලය |

01. සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් පහත දක්වා ඇති කාර්යාල පරිශ්‍රයන් සඳහා සනීපාරක්ෂක හා පිරිසිදු කිරීමේ සේවාව සැපයීම වෙනුවෙන් යෝග්‍යතා පූර්ණ ලංසුකරුවන්ගෙන් මුද්‍රා තබන ලද ලංසු කැඳවා සිටී.

    (i) ප්‍රධාන කාර්යාලය, 44/5 නාවල කාර්යාලය හා නවම් මාවත රථගාල

    (ii) දීප ව්‍යාප්ත ප්‍රාදේශීය කාර්යාල 17 ක් සඳහා

02. ලංසු කැඳවීම වෙළඳපොළ මිල සැදැහුම් (ජාතික) ලංසු පටිපාටිය අනුව සිදු කෙරෙනු ඇත.

03. කොන්ත්‍රාත් ප්‍රදානයට සුදුසුකම් ලැබීමට, සාර්ථක ලංසුකරුවා පහත අවශ්‍යතා සම්පූර්ණ කර තිබිය යුතුය.

    (i) ලංසුකරුවා සමාගම් ලියාපදිංචි කාර්යාලයේ / පළාත් සභාවේ / ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ලියාපදිංචි වූ සනීපාරක්ෂක සේවා සැපයීම පිළිබඳ වලංගු ව්‍යාපාර ලියාපදිංචියක් සහිත සීමිත සමාගමක්, හවුල්කාරීත්වයක් හෝ පරම හිමිකරුවකරුවකු විය යුතුය.

    (ii) ලංසුකරුවා මේ දක්වා අවම වශයෙන් වසර පහක (05) කාලයක් ශ්‍රී ලංකාව තුළ සනීපාරක්ෂක සේවා සපයා තිබිය යුතු අතර එම වසර පහ තුළ සේවය ලබා දුන් බවට ලේඛනමය සාක්ෂ්‍ය ඉදිරිපත් කිරීමට හැකියාව තිබිය යුතුය.

    (iii) ලංසුකරුවා සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය හෝ වෙනත් සංවිධානයක් විසින් මින් පෙර අසාධු ලේඛනගත කර නොතිබිය යුතුය.

04. කොන්ත්‍රාත්තු පිරිනැමීම සඳහා සුදුසුකම් ලැබීමට අවශ්‍ය වන සුදුසුකම් :

    (i) පසුගිය වසර පහ (05) තුළ රාජ්‍ය අංශයේ හෝ පුද්ගලික අංශයේ සංවිධානයක සනීපාරක්ෂක සහ පිරිසිඳු කිරීමේ සේවාවන් සඳහා රු.මිලියන 5 කට නොඅඩු එක් කොන්ත්‍රාත්තුවක් හෝ සාර්ථකව සපයා තිබීම.

    (ii) පසුගිය වසර තුන තුළ සිදු කළ සාමාන්‍ය සනීපාරක්ෂක සහ පිරිසිදු කිරීමේ සේවා කටයුතු වල වාර්ෂික අගය ශ්‍රී ලංකා රු.මිලියන 10 හෝ ඊට වැඩි අගයකින් යුක්ත විය යුතුය.

ඒ සඳහා කැමැත්තක් දක්වන ලංසුකරුවන් හට සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ **www.etfb.lk** දරණ වෙබ් අඩවියට පිවිසීමෙන් ලංසු ලේඛන ලබාගත හැක. සම්පූර්ණ කරන ලද ලංසු ලේඛන (Bidding Document) **2025.06.27** දින **උදේ 10.30** ට හෝ ඊට පෙර නාරාහේන්පිට, මෙහෙවර පියස ගොඩනැගිල්ලේ, 23 වන මහලේ පිහිටි ප්‍රසම්පාදන අංශයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටි අංක 08 ට බහාලිය යුතුය. ලියුම් කවරයේ වම්පස කෙලවරහි ටෙන්ඩර් අංකය සහ සනීපාරක්ෂක හා පිරිසිදු කිරීමේ සේවාව සැපයීම යනුවෙන් සඳහන් කළ යුතුය.

06. ලංසු වලංගු කාලය **2025.08.25** දක්වා විය යුතුය.

**සභාපති - ප්‍රසම්පාදන කමිටුව,**
**සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය,**
**තැ.පෙ. 807, 23 වන මහල, මෙහෙවර පියෙස,**
**නාරාහේන්පිට, කොළඹ 05.**

SELACINE MEDIA SOLUTIONS